ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020

ලකුණු දීමේ පටිපාටිය

67 - සංස්කෘත - ६७ संस्कृत

Department of Examinations-Sri Lanka

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2020
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

| | | | |
|---|---|---|---|
| (i) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 4/5 |
| (ii) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 3/5 |
| (iii) | ..................................................<br>..................................................<br>.................................................. | √ | △ 3/5 |
| (03) | එකතුව | ➡ | □ 10/15 |

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
**V. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

Department of Examinations-Sri Lanka

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :-** **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

***

Department of Examinations Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020 දෙසැම්බර්

67 - සංස්කෘත
ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හා මූලික පිරිවෙන් අවසාන විභාගය යනු සංස්කෘත විෂයය හදාරන ශිෂ්‍යයන් පෙනී සිටින ජාතික මට්ටමේ ප්‍රාථමික විභාග දෙකකි. එහෙයින් මෙහි දී සංස්කෘත භාෂාව පිළිබඳ මූලික දැනුමක් පමණක් අපේක්ෂා කැරේ. දේවනාගරී අක්ෂර නිවැරදි ව භාවිත කිරීම, (සංයුක්තාක්ෂර ඇතුළු ව) විභක්ති ප්‍රයෝග භාවිතය, සරල සංස්කෘත ඡේදයක් දළ වශයෙන් තේරුම් ගැනීම, නිවැරදි ව හා ව්‍යාකරණානුකූල ව පරිවර්තනය කිරීම, සරල සන්ධි තේරුම් ගැනීම, කෘදන්ත, ශබ්දප්‍රකෘති හඳුනා ගැනීම, ශබ්ද හා ධාතු වරනැඟීම, සරල සංස්කෘත වාක්‍ය නිර්මාණය කිරීම යන ශක්‍යතා පිළිබඳ ඇගයීමත් කෙටි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ හැකියාව මැන බැලීමත් මෙම ප්‍රශ්න පත්‍රයෙන් අපේක්ෂිත ය.

පිළිතුරු පත්‍ර ලකුණු කිරීම සඳහා උපදෙස්

මෙවර ආදර්ශ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීමේ දී දේවනාගරී අක්ෂර භාවිතය පිළිබඳ ශිෂ්‍යයන්ගේ කිසියම් ප්‍රගතියක් දක්නට ලැබුණ ද පිළිතුරු ඇගයීමේ දී දේවනාගරී අක්ෂර භාවිතය සම්බන්ධයෙන් දක්නට ලැබෙන අඩුපාඩු ගැන තදින් ක්‍රියා නොකළ යුතු ය. දේවනාගරී අක්ෂර භාවිත කරන ලෙස උපදෙස් දී නැති විට, පිළිතුරු ලිවීමේ දී දේවනාගරී අක්ෂර වෙනුවට සිංහල අක්ෂර නිවැරදි ලෙස භාවිත කොට ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

67 - සංස්කෘත

ප්‍රශ්න අංක 01 සහ 02 ඇතුළු ව ප්‍රශ්න 05 ට පමණක් පිළිතුරු සපයා තිබිය යුතු ය.

01. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත ය. පළමු කොටසින් බහුවරණ ක්‍රමයට සංස්කෘත ව්‍යාකරණය හා සාහිත්‍ය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම අරමුණු වන අතර දෙවන කොටසින් කෙටි පිළිතුරු සැපයීමේ ශක්‍යතාව පරීක්ෂා කිරීම අරමුණ වේ. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 20කි. මෙහි කොටස් දෙකේ ම එක පිළිතුරකට ලකුණ බැගින් දෙන්න. මෙය අනිවාර්ය ප්‍රශ්නයකි.

Department of Examinations-Sri Lanka

02 වන ප්‍රශ්නය

සරල සංස්කෘත වාක්‍ය සිංහලයටත් සරල සිංහල වාක්‍ය සංස්කෘතයටත් පරිවර්තනය කිරීමේ හැකියාව පිරික්සීම මෙහි අරමුණයි. මෙහි දී පිළිතුරුවල උක්තාඛ්‍යාත සම්බන්ධය ගැන සැලකිලිමත් විය යුතු ය. එක ම අදහස නිවැරදි ව විවිධාකාරයෙන් ප්‍රකාශයට පත් වී තිබිය හැකි ය. ඒ නිසා අදහස නිවැරදි ව ප්‍රකාශ වී ඇත් නම් සාපේක්ෂ ව බලා ලකුණු දෙන්න.

මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 20කි. එබැවින් එක් වාක්‍යයකට ලකුණු 02කි. මෙම ප්‍රශ්නයේ දෙවන කොටස සඳහා දේවනාගරී අක්ෂර අනිවාර්ය කොට ඇති බැවින් සිංහල අකුරෙන් නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් එක් වාක්‍යයකට නියම කොට ඇති ලකුණුවලින් 01 බැගින් අඩු කරන්න. මෙය ද අනිවාර්ය ප්‍රශ්නය කි.

වරණීය ප්‍රශ්න අංක 03,04,05,06 හා 07

03. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නයෙන් සංස්කෘත භාෂාව භාවිතයේ දී අත්‍යවශ්‍ය භාෂා ප්‍රයෝග පිළිබඳ දැනුම පිරික්සා බැලීම අරමුණ වේ. එබැවින් ප්‍රශ්නය කොටස් හතරකින් සමන්විත ය. කොටස් හතරට ම සම ලකුණු හිමි වේ. එක් පිළිතුරකට 01 ලකුණ බැගින් දෙන්න. මුළු ලකුණු 20යි.

04. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නය නාම වරනැඟීම හා ආඛ්‍යාත වරනැඟීම යන කොටස් දෙකෙන් හා ඡේදයක හිස්තැන් පිරවීම යනුවෙන් කොටසකින් ද යුක්ත ය. නාම වරනැඟීම යටතේ විවිධ නාම පද විභක්තීන්හි සුදුසු පරිදි යොදා ගැනීමේ හැකියාවත් ක්‍රියාපද සාධනයේ දී විවිධ ධාතු පුරුෂත්‍රයෙහි ලකාරවල යෙදීමේ හැකියාවත් මැන බැලීමත් වරනැඟීමේ දි විභක්ති ප්‍රත්‍ය වනපොත් කිරීම අවශ්‍ය වන්නාක් මෙන් ම ශබ්ද රූප තනා ගැනීමේ දී ස්මරණය අවශ්‍යවන හෙයින් එම වාචෝද්ගත කිරීම අවබෝධයෙන් කළයුතු නිසා ඒ සඳහා ශිෂ්‍යයා යොමු කිරීම මෙහි අපේක්ෂාව වේ. මෙහි තෙවන කොටසින් වාක්‍යයක් නිසිපරිදි තේරුම් ගෙන හිස්තැන් සම්පූර්ණ කිරීමෙන් වචන නියමිත ස්ථානයෙහි යෙදීමේ හැකියාව පරීක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. අපේක්ෂිත පිළිතුරු සංඛ්‍යාව ද 20කි. එහෙයින් නිවැරදි එක් පිළිතුරකට 01 ලකුණ බැගිනි.

05. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නයෙන් සංස්කෘත සරල ඡේදයක් කියවා අවබෝධ කර ගැනීමේ ද සන්ධි පද විසන්ධි කිරීමේ ද ශබ්ද ප්‍රකෘති පද හඳුනා ගැනීමේ ද හැකියාව මැන බැලීම අපේක්ෂාවයි. ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. පළමු කොටසේ පිළිතුරකට ලකුණු 02 බැගින් ද දෙවන සහ තුන් වන කොටසේ පිළිතුරකට ලකුණු 01 බැගින් ද දෙන්න.

Department of Examinations, Sri Lanka

06. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නය ද කොටස් හතරකින් සමන්විත වේ. එක කොටසින් ග්‍රන්ථ වින්‍යාසයත් දෙක කොටසින් සාහිත්‍යාත්මක ශ්ලෝක ස්මරණයත් එහි අර්ථාවබෝධයත් තෙවන කොටසින් සංශ්ලේෂණයත් විශ්ලේෂණයත් හතරවන කොටසින් විභක්ති හා නාමපද සාධනයත් මැනීම අපේක්ෂාව යි. ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි. 1 කොටස ලකුණු 03යි. 2.කොටස ලකුණු 04යි. 3. කොටස ලකුණු 05යි. 4. කොටස ලකුණු 08යි.

07. වන ප්‍රශ්නය

මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් ශිෂ්‍යයාගේ නිරීක්ෂණ, ප්‍රකාශන හා නිර්මාණ ශක්තිය පරීක්ෂා කිරීම, දෙවන කොටසින් පද වෙන් කොට ලිවීමේ හැකියාව, හා තෙවන කොටසින් නියමිත ග්‍රන්ථාධ්‍යයන පරීක්ෂා කිරීම අපේක්ෂාව යි. වචන තුනක් වත් අඩංගු වී ඇති නිවැරදි එක් වාක්‍යයකට ලකුණු 03යි. වචන තුනකට අඩු එහෙත් නිවැරදි වාක්‍යයට සාපේක්ෂ ව බලා ලකුණු දෙන්න. දෙවන කොටසේ පද නිවැරදි ව වෙන් කොට ඇති සාපේක්ෂව බලා ලකුණු දෙන්න. ලකුණු 05යි. තෙවන කොටසට ලකුණු 05යි. එක ප්‍රයෝගයට එක ලකුණකි. ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20ක.

Department of Examinations-Sri Lanka

ලකුණු දීමේ පටිපාටිය

පිළිතුරු පත්‍රයට හිමි මුළු ලකුණු සංඛ්‍යාව 100කි.

01. වන ප්‍රශ්නයට ලකුණු (a)01x10+(b)01x10=20කි.

02. වන ප්‍රශ්නයට ලකුණු (a)02x05+(b)02x05=20කි.

03. වන ප්‍රශ්නයට ලකුණු 20කි. (05+05+05+05)

04. වන ප්‍රශ්නයට ලකුණු 20කි. (05+05+10)

05. වන ප්‍රශ්නයට ලකුණු 20කි. (02x05+05+05)

06. වන ප්‍රශ්නයට ලකුණු 20කි. (03+04+05+08)

07. වන ප්‍රශ්නයට ලකුණු 20කි. (02x05+05+05)

| | | |
|---|---|---|
| 01 වන සහ 02 වන අනිවාර්ය ප්‍රශ්න දෙකට | (02x20) | ලකුණු 40යි. |
| වරණීය ප්‍රශ්න තුනට | (03x20) | ලකුණු 60යි. |
| | මුළු ලකුණු | 100යි. |

OL/2020/67-STE

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**67 STE**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Ord. Level) Examination, 2020

සංස්කෘත
சம்ஸ்கிருதம்
**Sanskrit**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.

Use additional reading time to go through the question paper, select the questions you will answer and decide which of them you will prioritise.

Index No. : ...........................

**වැදගත්** : මෙම ප්‍රශ්න පත්‍රයට **එක් භාෂාවකින් පමණක්** පිළිතුරු සැපයිය යුතුයි.

- ✳ පළමුවන හා දෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් ලකුණු **40** කි.
- ✳ සෙසු ව්‍යුහගත ප්‍රශ්න **5** න්, **3** කට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **20** බැගින් මුළු ලකුණු **60** කි.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය.

**முக்கியம்** : இவ்வினாத்தாளுக்குரிய விடைகளை **ஒரு மொழியில் மாத்திரமே எழுதுதல்** வேண்டும்.

- ✳ **முதலாம், இரண்டாம்** வினாக்கள் கட்டாயமானவை. ஒரு வினாவிற்கு **20** புள்ளிகள் வீதம் மொத்தப் புள்ளிகள் **40** ஆகும்.
- ✳ ஏனைய கட்டமைப்பு வகை வினாக்கள் **5** இல் **3** இற்கு மாத்திரம் விடையளித்தல் வேண்டும். ஒரு வினாவுக்கு **20** புள்ளிகள் வீதம் மொத்தப் புள்ளிகள் **60** வழங்கப்படும்.
- ✳ **இவ்வினாத்தாளிலேயே விடையளித்தல் வேண்டும்.**

**Important** : *This question paper should be answered entirely in **one language only**.*

- ✳ **First** and **second** questions are compulsory. Each question carries **20** marks and total marks is **40**.
- ✳ Only **3** out of the other **5** structured questions should be answered. Each question carries **20** marks. Total **60** marks.
- ✳ **Answers should be written on this paper itself.**

## For Examiner's Use Only

| Question No. | Marks Awarded |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| Total | |

**Final Marks**

| | |
|---|---|
| In numbers | |
| In letters | |

**Code Numbers**

| | |
|---|---|
| Marking Examiner | |
| Checked by | 1 |
| | 2 |
| Supervised by | |

[ 2 වැනි පිටුව බලන්න. / பக். 2 ஐப் பார்க்க / See page 2

1. (a) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
சரியான விடையைத் தெரிவுசெய்து அதன் கீழே கோடிடுக.
Select the correct answer and underline it.

(i) केवलं **कण्ठजाक्षराणि** ।

(A) ऊ ण थ ड क (B) क ग ठ ञ ज

(C) क ग ड द ण (D) अ क ह ग घ

(ii) केवलं **सन्ध्यक्षराणि** ।

(A) ए अय् ओ अव् (B) अय् आय् अव् आव्

(C) ए ऐ ओ औ (D) ए अय् ऐ आय्

(iii) **नरांश्च** इति ।

(A) व्यञ्जनसन्धिः । (B) विसर्गसन्धिः ।

(B) अनुस्वारसन्धिः । (D) स्वरसन्धिः ।

(iv) **आत्मनि** इति ।

(A) स्त्रीलिङ्ग प्रथमा विभक्ति एकवचनम् ।

(B) पुरुषलिङ्ग सप्तमी विभक्ति एकवचनम् ।

(C) नपुंसकलिङ्ग प्रथमा विभक्ति एकवचनम् ।

(D) नपुंसकलिङ्ग सप्तमी विभक्ति एकवचनम् ।

(v) **अवदम्** इति ।

(A) लङ् लकार परस्मैपद उत्तमपुरुष एकवचनम् ।

(B) लट् लकार परस्मैपद मध्यमपुरुष एकवचनम् ।

(C) लङ् लकार आत्मनेपद उत्तमपुरुष एकवचनम् ।

(D) लट् लकार परस्मैपद उत्तमपुरुष एकवचनम् ।

(vi) **रविः** इत्यस्य पदस्य पर्यायपदम् ।

(A) अनलः । (B) अनिलः । (C) सूर्यः । (D) अग्निः ।

(vii) ✓**बुध्** - लोट् लकार परस्मैपद प्रथमपुरुष बहुवचनम् ।

(A) बोधन्तु । (B) बोधन्ताम् । (C) बुध्यन्ते । (D) बुध्यन्ताम् ।

[ 3 වැනි පිටුව බලන්න. / பக். 3 ஐப் பார்க்க / *See page* 3

Department of Examinations-Sri Lanka

(viii) **सूर्यशतकस्य** कर्ता ।

(A) श्री कुसुमदेवः । (B) श्री हर्षदेवः ।

(C) श्री बाणभट्टः । (D) श्री मयूरभट्टः ।

(ix) महाकवि **कालिदासस्य** कृतिः ।

(A) विक्रमोर्वशीयम् । (B) गीतगोविन्दम् ।

(C) उत्तररामचरितम् । (D) सौन्दरनन्दम् ।

(x) **सप्तसप्ततिः** ।

(A) १७ (B) ७७ (C) ८७ (D) ९७

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 *marks*)

(b) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
பின்வரும் வினாக்களுக்குச் சுருக்கமான விடை எழுதுக.
Give short answers to the following questions.

(i) දෘෂ්ටාන්ත ශතකයේ කතුවරයා කවුද?
த்ருஷ்டாந்த காப்பியத்தினை எழுதியவர் யார்?
Who is the author of *dṛṣṭānta śataka*?

..........................................................................................

(ii) ව්‍යාසකාරයේ ඇති ශ්ලෝක තෝරාගෙන ඇත්තේ කුමන ග්‍රන්ථයෙන්ද?
வியாசகரத்திலுள்ள ஸ்லோகம் எந்நூலிலிருந்து எடுக்கப்பட்டது?
From which book have the *ślokas* in *Vyasakāra* been chosen?

..........................................................................................

(iii) හිතෝපදේශයේ කතුවරයා පවසන පරිදි එය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** ලියන්න.
கீதோபதேசத்தின் ஆசிரியரின் கருத்துப்படி அதனைக் கற்பதனால் கிடைக்கும் பயன்கள் **இரண்டை** எழுதுக.
As the author of *Hitopadēśa* says write **two** benefits of learning it.

(1) ..........................................................................................

(2) ..........................................................................................

(iv) ශතක ග්‍රන්ථයක ඇතුළත් විය යුතු නිශ්චිත ශ්ලෝක සංඛ්‍යාවක් තිබේද? තිබේ නම් කීයද?
சதக நூலொன்றில் உள்ளடங்கியிருக்க வேண்டிய சுலோகங்களின் எண்ணிக்கையொன்று உண்டா? அவ்வாறெனின் எத்தனை?
Is there an exact number of *ślokas* which should include in a *śataka grantha*? If so, how many?

..........................................................................................

(v) නීති ශතකයේදී දැඩි උපහාසයට ලක්වන්නේ කවර පුද්ගලයෝ ද?
நீதி சதக்க நூலின்படி அவமரியாதைக்குட்பட்டவர் யார்?
Who are insulted at sarcasm in *Nītiśataka*?

..........................................................................................

[ 4 වැනි පිටුව බලන්න. / பக். 4 ஐப் பார்க்க / *See page* 4

Department of Examinations-Sri Lanka

(vi) මහාකවි කාලිදාසයන්ගේ ඍතුසංහාරයේ වර්ණිත ඍතු කීයද?
மகாகவி காளிதாசருடைய ரிதுசங்கார என்னும் நூலில் குறிப்பிடப்பட்ட பருவ காலங்கள் எத்தனை?
How many season are mentioned in *Ritusanhāra* of *Mahākavi Kālidāsa's*?

..........................................................................................

(vii) පහත සඳහන් පාඨයේ අර්ථය කුමක් ද?
பின்வரும் பகுதியின் கருத்து யாது?
What is the meaning of the text below?

**कृतस्य करणं नास्ति ।**

..........................................................................................

(viii) පහත ශ්ලෝක පාදය සම්පූර්ණ කරන්න.
பின்வரும் ஸ்லோகங்களைப் பூரணப்படுத்துக.
Complete the following poem lines.

**काव्यशास्त्रविनोदेन कालो गच्छति धीमताम् ।**

..........................................................................................

(ix) පහත සඳහන් මාසවල **සිංහල** නම් ලියන්න.
பின்வரும் மாதங்களின் பெயர்களை **தமிழில்** எழுதுக.
Write the **English** names of the months stated below.

**चैत्रः - ज्येष्ठः - आषाढः - माघः**

.......................... .......................... .......................... ..........................

(x) පහත සඳහන් වාක්‍යයේ තේරුම කුමක් ද?
பின்வரும் வாக்கியத்தின் கருத்து யாது?
What is the meaning of the sentence stated below?

**तन्न युक्तम् ।**

..........................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

**2.** (a) පහත දැක්වෙන වාක්‍ය **සිංහලයට** පරිවර්තනය කරන්න.
பின்வரும் வாக்கியங்களைத் **தமிழில்** மொழிபெயர்க்குக.
Translate the following sentences into **English.**

(i) तत् सुमनस्य 'बालादर्शः' नाम पुस्तकम् । ..........................................

(ii) विद्यासमः बन्धुः नास्ति । ..........................................

(iii) छात्राः पाठालयम् अगच्छन् । ..........................................

(iv) वासना जलतडागे क्रीडति । ..........................................

(v) मम हस्ते कन्दुकं वर्तते । ..........................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) පහත දැක්වෙන වාක්‍ය **සංස්කෘතයට පරිවර්තනය** කොට **දේවනාගරී අක්ෂරයෙන්** ලියන්න.
பின்வரும் வாக்கியங்களை **சம்ஸ்கிருதத்தில் மொழிபெயர்த்து** அவற்றை **தேவநாகரீ எழுத்தில்** எழுதுக.
Translate the following sentences into **Sanskrit and write them in *Devanāgarī* script.**

(i) අපි ගමට යමුද?
நாங்கள் ஊருக்குப் போவோமா?
Shall we go to the village?

..........................................................................................

[ 5 වැනි පිටුව බලන්න. / பக். 5 ஐப் பார்க்க / *See page* 5

0009201

Department of Examinations-Sri Lanka

(ii) සුබ උදෑසනක් වේවා!
காலை வணக்கம்!
Good morning!

..........................................................................................................

(iii) මිනිස්සු වේගයෙන් දුවති.
மக்கள் வேகமாக ஓடுகிறார்கள்.
People run fast.

..........................................................................................................

(iv) මේ විපත්ති කාලයකි.
இது அனர்த்த காலமாகும்.
This is a distressed period.

..........................................................................................................

(v) කල්පනාවෙන් සිටින්න.
கவனமாக இருங்கள்.
Be on alert.

..........................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

Department of Examinations-Sri Lanka

**3.** (a) පහත සඳහන් ආදර්ශ පද රටාව දෙස බලා, හිස් තැනට **ගැළපෙන වචනය** ලියන්න.
பின்வரும் சொற்களின் மாதிரியை அவதானித்து, வெற்றிடங்களுக்குப் **பொருத்தமான சொல்லை** எழுதுக.
Fill in the blanks **with suitable words** in accordance to the example word pattern mentioned below.

| नरः | नरौ | नराः |
|---|---|---|
| ................ | ................ | धनैः |
| ................ | आवाम् | ................ |
| मुनिः | ................ | मुनयः |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(b) प्राथमिक । इति । राजसभा । आलोच्य । पठितुम् ।
මෙම වචන භාවිත කරමින් පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.
இந்தச் சொற்களைப் பயன்படுத்தி பின்வரும் அட்டவணையைப் பூரணப்படுத்துக.
Complete the following table using these words.

| समास | तुमन्त | तद्धित | निपात | पूर्वक्रिया |
|---|---|---|---|---|
| ........ | ........ | ........ | ........ | ........ |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 6 වැනි පිටුව බලන්න. / பக். 6 ஐப் பார்க்க / *See page 6*

(c) පහත දැක්වෙන පදවල බහුවචන රූප ලියන්න.
பின்வரும் சொற்களின் பன்மை வடிவங்களை எழுதுக.
Write the **Plural** forms of the following words.

भूमौ । ..............  नरेण । ..............  त्वम् । ..............

कथयतु । ..............  अपठत् । ..............

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(d) පහත දැක්වෙන පදවල **ශබ්ද මූලය හෝ ධාතු මූලය** ලියන්න.
பின்வரும் சொற்களின் **பெயரடியை** அல்லது **வினையடியை** எழுதுக.
Write the **stem or root** of the following words.

शिशुभिः ।..............  भ्रातरः । ..............  वर्तते ।..............

धावन्ति । ..............  नयते । ..............

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

**4.** (a) පහත සඳහන් නාම වරනැගීම සම්පූර්ණ කරන්න.
பின்வரும் **பெயர்களின் வடிவங்களைப்** பூரணப்படுத்துக.
Complete the following **noun declensions**.

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमा | .............................. | तौ | ते |
| द्वितीया | मूषिकम् | मूषिकौ | .............................. |
| तृतीया | .............................. | लताभ्याम् | लताभिः |
| चतुर्थी | नद्याः | नद्योः | .............................. |
| सप्तमी | .............................. | पित्रोः | पितृषु |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 7 වැනි පිටුව බලන්න. / பக். 7 ஐப் பார்க்க / *See page* 7

0009199

Department of Examinations-Sri Lanka

(b) පහත සඳහන් **ආඛ්‍යාත** වරනැගීම් සම්පූර්ණ කරන්න.
பின்வரும் **வினை** வடிவங்களைப் பூரணப்படுத்துக.
Complete the following **verbal** declensions.

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथम पुरुष | भजते | .................... | .................... |
| मध्यम पुरुष | .................... | .................... | अपृच्छन् |
| उत्तम पुरुष | .................... | हरिष्यावः | हरिष्यामः |

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(c) වරහන් තුළ ඇති වචන සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.
அடைப்புக்குறியில் தரப்பட்டுள்ள சொற்களைப் பொருத்தமான விதத்தில் பயன்படுத்தி இடைவெளிகளை நிரப்புக.
Fill in the blanks with suitable words given in the brackets.

(वञ्चने - मधुरं - किमुच्यते - तेन - परिभ्रमन् - न - पानीयं - सर्वे - यत्नाः - आह)

शृगालः ............... पातुं वापीं गतो जले ममज्ज। ..............बहिर्गन्तुं बहवो ..................कृताः। किन्तु ते .................. मुधाभवन्। अत्रान्तरे कोऽप्यजः पिपासाकूलः ................. तत्रागतः। अपृच्छच्च शृगालम्। सखे अपि ................ जलमिति। शृगालः परेषां ................ नितरां पटुः। अतः स .................. मधुरमिति .................... केवलं पीयूषमेव प्रभूतं पिबतोऽपि न मे वाञ्छा निवर्तते। ................. शक्नोम्येतां वापीं हातुम् इति ॥

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

**5.** (a) පහත දැක්වෙන ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
பின்வரும் பந்தியைப் பயன்படுத்தி கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடையளிக்குக.
Answer the questions given below based on the following passage.

धारा नगर्यां ***सिन्धुलसंज्ञो राजा*** चिरं प्रजाः पर्यपालयत्। वार्धके तस्य भोज इति पुत्रोऽजायत। स यदा पञ्चवर्षदेशियां वयोऽवस्थामस्पृशत्तदा पितात्मानं जराजर्जरितदेहं ज्ञात्वानुजं मुञ्जं महाबलमालोक्य पुत्रञ्च बालं वीक्ष्य विचारयामास। यद्यहं राज्यधुरावहनसमर्थं सोदरमपहाय पुत्राय बालाय राज्यं प्रयच्छामि। तदा माहालोकापवादः ॥

[ 8 වැනි පිටුව බලන්න. / பக். 8 ஐப் பார்க்க / *See page* 8

Department of Examinations-Sri Lanka

(i) රජුට අපවාද විඳින්නට සිදුවන්නේ කුමක් නිසාද?
எதன் காரணமாக அரசன் அவமதிப்புக்குள்ளானான்?
For what reason is the king dispraised?

..............................................................................................

(ii) රජුගේ පුතා කවුද?
அரசனின் மகன் யார்?
Who is the king's son?

..............................................................................................

(iii) මුඤ්ජගේ අයියා කවුද?
முஞ்ஜனுடைய அண்ணன் யார்?
Who is the elder brother of *Muñja*?

..............................................................................................

(iv) දුබල වූ සිරුරක් තිබුණේ කාටද?
நலிந்த உடல் யாருக்கு இருந்தது?
Who had a weak body?

..............................................................................................

(v) යටින් ඉරි ඇඳි කොටසෙහි තේරුම කුමක්ද?
கீழே கோடிடப்பட்டுள்ள பகுதியின் கருத்து யாது?
What is the meaning of the underlined part?

..............................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) ඉහත ඡේදයේ දැක්වෙන විසර්ග සන්ධි පද දෙකක්, ස්වර සන්ධි පද දෙකක් හා ව්‍යඤ්ජන සන්ධි පද එකක් තෝරා විසන්ධි කොට ලියන්න.
மேலே பந்தியிலுள்ள **இரண்டு விஸர்க்க சந்திகளையும் இரண்டு உயிரீற்று சந்திகளையும் ஒரு மெய்யீற்று சந்தியையும்** தெரிவுசெய்து அவற்றைச் சந்தி பிரித்து எழுதுக.
Choose **two *visarga*** *sandhis*, **two *svara*** (vowel) *sandhis* and **one *vyañjana*** (consonant) *sandhi* from the above passage and disjoin them.

1. ..............................................................................................

2. ..............................................................................................

3. ..............................................................................................

4. ..............................................................................................

5. ..............................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[ 9 වැනි පිටුව බලන්න. / பக். 9 ஐப் பார்க்க / *See page* 9

0009200

Department of Examinations-Sri Lanka

(c) ඉහත ඡේදයෙන් ප්‍රථමා විභක්ති පද **පහක්** තෝරා ඒවායෙහි ශබ්ද ප්‍රකෘති ලියන්න.
மேலேயுள்ள பந்தியிலிருந்து முதலாம் வேற்றுமைச் சொற்கள் **ஐந்தைத்** தெரிவுசெய்து அவற்றின் பெயரடிகளை எழுதுக.
Choose **five** words in *prathamā vibhakti* from the above passage and write their stems.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

4. ..........................................................................................................

5. ..........................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

**6.** (a) පඤ්චතන්ත්‍රයේ තන්ත්‍ර **තුනක්** නම් කරන්න.
பஞ்சதந்திரத்தின் **மூன்று** தந்திரங்களின் பெயர்களைத் தருக.
Name **three** *tantra* of the *Pañchatantra*.

1. ..........................................................................................................

2. ..........................................................................................................

3. ..........................................................................................................

(ලකුණු 03 යි)/(03 புள்ளிகள்)/(03 marks)

(b) උපදේශ ශ්ලෝකයක් ලියා, එහි සරල අර්ථය ලියන්න.
உபதேச சுலோகமொன்றை எழுதி, அதன் எளிய கருத்தை எழுதுக.
Write **one** didactic *śloka* and the simple meaning of it.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(ලකුණු 04 යි)/(04 புள்ளிகள்)/(04 marks)

[10 වැනි පිටුව බලන්න. / பக். 10 ஐப் பார்க்க / *See page* 10

Department of Examinations-Sri Lanka

(c) අභිඥානශාකුන්තලයේ අන්තර්ගතය පිළිබඳ සංක්ෂිප්තයක් ලියන්න.
அபிக்ஞான சாகுந்தலம் காப்பியத்தின் உள்ளடக்கம் பற்றிய சுருக்கமொன்றை எழுதுக.
Write a summary of the content of *Abhignānaśākuntala*.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

(d) උපදේශ කාව්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
உபதேச இலக்கியங்கள் பற்றிய சிறு அறிமுகமொன்று தருக.
Make a short introduction to didactic poems.

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................


(ලකුණු 08 යි)/(08 புள்ளிகள்)/(08 marks)

[11 වැනි පිටුව බලන්න. / பக். 11 ஐப் பார்க்க / *See page* 11

0009202

Department of Examinations-Sri Lanka

**7.**



(a) චිත්‍රය ඇසුරෙන් **වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය පහක් දේවනාගරී** අකුරෙන් ලියන්න.
(එක ම වචනය දෙවරකට වඩා භාවිත නොකළ යුතු ය.)
மேலுள்ள படத்தைப் பயன்படுத்தி ஒவ்வொன்றும் **மூன்று சொற்களுக்குக் குறையாத சம்ஸ்கிருத வாக்கியங்கள் ஐந்தை** தேவநாகரீ எழுத்தில் எழுதுக. (ஒரு சொல்லை இரண்டு தடவைகளுக்கு அதிகமாகப் **பயன்படுத்தக்கூடாது**.)
With reference to the picture, write **five** sentences using not less than three words each in the ***Devanāgarī*** Script. (A word **cannot be used** more than twice.)

1. ....................................................................................................
2. ....................................................................................................
3. ....................................................................................................
4. ....................................................................................................
5. ....................................................................................................

(ලකුණු 10 යි)/(10 புள்ளிகள்)/(10 marks)

(b) පහත සඳහන් ශ්ලෝකය **පද වෙන් කොට** නැවත ලියන්න.
பின்வரும் சுலோகத்தை தனித்தனிச் சொற்களாகப் பிரித்து மீண்டும் எழுதுக.
Rewrite the following *śloka* putting **each word separately**.

रूपयौवनसम्पन्ना विशालकुलसम्भवाः ।
विद्याहिना न शोभन्ते निर्गन्धा इव किंशुकाः ॥

....................................................................................................
....................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

[12 වැනි පිටුව බලන්න. / பக். 12 ஐப் பார்க்க / *See page* 12

Department of Examinations Sri Lanka

(c) ශතක ග්‍රන්ථ අධ්‍යයනයේ ප්‍රයෝජන **පහක්** ලියන්න.
சதக நூல்களைக் கற்பதன் பயன்கள் **ஐந்து** எழுதுக.
Write **five** benefits of studying *śataka* books.

1. ...............................................................................................................

2. ...............................................................................................................

3. ...............................................................................................................

4. ...............................................................................................................

5. ...............................................................................................................

(ලකුණු 05 යි)/(05 புள்ளிகள்)/(05 marks)

* * *

Department of Examinations-Sri Lanka

ආදර්ශ පිළිතුරු

01. (a) (ලකුණු 10 යි)

(i) (D) अ क ह ग घ

(ii) (C) ए ऐ ओ औ

(iii) (A) व्यञ्जनसन्धिः।

(iv) (B) पुरुषलिङ्ग सप्तमी विभक्ति एकवचनम्।

(v) (A) लङ् लकार परस्मैपद उत्तमपुरुष एकवचनम्।

(vi) (C) सूर्यः।

(vii) (A) बोधन्तु।

(viii) (D) श्री मयूरभट्टः।

(ix) (A) विक्रमोर्वशीयम्।

(x) (B) ७७

(a) (ලකුණු 10යි)

(i) කුසුමදේව

(ii) ගරුඩපුරාණයෙන්

(iii) සංස්කෘත උක්තීන්හි දක්ෂ බව, විසිතුරු වචන භාවිතයේ හැකියාව, නීතිවිද්‍යා ඥානය

(iv) නැත

(v) අඥාන පුද්ගලයන්

(vi) 06

(vii) කළ දෙයෙහි කිරීමක් නැත

(viii) काव्यशास्त्रविनोदेन कालो गच्छति धीमताम्।

व्यसनेन च मूर्खाणां निद्रया कलहेन वा॥

Department of Examinations-Sri Lanka

(ix) බක්/අප්‍රේල්, පොසොන්/ජුනි, ඇසළ/ජූලි, නවම්/පෙබරවාරි

(x) එය සුදුසු නැත.

02. (a) (ලකුණු 10යි)

i. එය සුමනගේ බාලාදර්ශ නම් පොතයි.

ii. දැනුම හා සමාන නෑයෙක් නැත.

iii. ශිෂ්‍යයෝ පාසලෙන් පැමිණියහ.

iv. වාසනා ජලතඩාගයෙහි සෙල්ලම් කරයි.

v. මගේ අතේ පන්දුවක් ඇත.

(b) (ලකුණු 10යි)

(i) किं वयं ग्रामं गच्छाम ।

(ii) सुप्रभातम् ।

(iii) नराः वेगेन धावन्ति ।

(iv) अयं विपत्कालः ।

(v) सावधानेन तिष्ठ ।

Department of Examinations-Sri Lanka

03. (a) (ලකුණු 05යි)

| | | |
|---|---|---|
| धनेन | धनाभ्याम् | धनैः |
| अहम् | आवाम् | वयम् |
| मुनिः | मुनी | मुनयः |

(ලකුණු 05 යි)

| | | | | |
|---|---|---|---|---|
| समास | तुमन्त | तद्धित | निपात | पूर्वक्रिया |
| राजसभा। | आलोच्य। | प्राथमिक। | इति। | पठितुम्। |

(c) (ලකුණු 05යි)

भूमिषु। नरैः। यूयम्।

कथयन्तु। अपठन्।

(d) (ලකුණු 05යි)

शिशु। भ्रातृ। वृत्। धाव्। नी।

Department of Examinations-Sri Lanka

4. (a) (ලකුණු 05යි)

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथमा | सः | तौ | ते |
| द्वितीया | मूषिकम् | मूषिकौ | मूषिकाः |
| तृतीया | लतया | लताभ्याम् | लताभिः |
| षष्ठी | नद्याः | नद्योः | नदीनाम् |
| सप्तमी | पितरि | पित्रोः | पितृषु |

(b) (ලකුණු 05යි)

| | एकवचनम् | द्विवचनम् | बहुवचनम् |
|---|---|---|---|
| प्रथम पुरुष | भजते | भजेते | भजन्ते |
| प्रथम पुरुष | अपृच्छत् | अपृच्छतम् | अपृच्छन् |
| उत्तम पुरुष | हरिष्यामि | हरिष्यावः | हरिष्यामः |

Department of Examinations Sri Lanka

(c) (ලකුණු 10යි)

शृगालः **पानीयं** पातुं वापीं गतो जले ममज्ज। **तेन** बहिर्गन्तुं बहवो **यत्नाः** कृताः। किन्तु ते **सर्वे** मुधाभवन्। अत्रान्तरे कोऽप्यजः पिपासाकूलः **परिभ्रमन्** तत्रागतः। अपृच्छच्च शृगालम्। सखे अपि **मधुरं** जलमिति। शृगालः परेषां **वञ्चने** नितरां पटुः। अतः स **किमुच्यते** मधुरमिति **न** केवलं पीयूषमेव प्रभूतं पिबतोऽपि न मे वाञ्छा निवर्तते। **आह** शक्नोम्येतां वापीं हातुम् इति॥

5. (a) (ලකුණු 10 යි)

धारा नगर्यां ***सिन्धुलसंज्ञो राजा*** चिरं प्रजाः पर्यपालयत्। वार्धके तस्य भोज इति पुत्रोऽजायत। स यदा पञ्चवर्षदेशियां वयोऽवस्थामस्पृशत्तदा पितात्मानं जराजर्जरितदेहं ज्ञात्वानुजं मुञ्जं महाबलमालोक्य पुत्रञ्च बालं वीक्ष्य विचारयामास। यद्यहं राज्यधुरावहनसमर्थं सोदरमपहाय पुत्राय बालाय राज्यं प्रयच्छामि। तदा महालोकापवादः॥

i. බාල පුතාට රජකම ලබාදුනහොත්

ii. භෝජ

iii. රජතුමාගේ මල්ලී

iv. භෝජට

v. සින්ධුල නම් රජු

(b) ඉහත ඡේදයේ දක්වෙන විසර්ග සන්ධි පද එකක්, ස්වර සන්ධි පද දෙකක් හා ව්‍යඤ්ජන සන්ධි පද දෙකක් තෝරා විසන්ධි කොට තිබිය යුතු ය.

(c) ඉහත ඡේදයෙන් ප්‍රථමා විභක්ති පද පහක් තෝරා ඒවායේ ශබ්ද ප්‍රකෘති ලියා තිබිය යුතු ය.

(ලකුණු 05 යි)

Department of Examinations-Sri Lanka

06. (a) පඤ්චතන්ත්‍රයේ තන්ත්‍ර පහෙන් තුනක් නම් කොට ලිබිය යුතු ය. (ලකුණු 03 යි)

(b) උපදේශ ශ්ලෝකයක් ලියා එහි තේරුම ලියා තිබිය යුතු ය. (ලකුණු 04යි)

(c) අභිඥානශාකුන්තලයේ අන්තර්ගතය පිළිබඳ සංක්ෂිප්තයක් ලියා තිබිය යුතු ය. (ලකුණු 05යි)

(d) උපදේශ කාව්‍ය පිළිබඳ කෙටි හැඳින්වීමක් කොට තිබිය යුතු ය. (ලකුණු 08යි)

07.

(a) චිත්‍රය ඇසුරෙන් වචන තුනකට නොඅඩු සංස්කෘත වාක්‍ය පහක් **දේවනාගරී** අකුරෙන් ලියා තිබිය යුතු ය. (එක ම වචනය දෙවරකට වඩා භාවිත නො කළ යුතු ය.) (ලකුණු 10යි)

(b) (ලකුණු 05යි)

रूप-यौवन-सम्पन्नाः विशाल-कुल-सम्भवाः ।
विद्याहिनाः न शोभन्ते निर्गन्धाः इव किंशुकाः ॥

(c) ශතක ග්‍රන්ථ අධ්‍යයනයේ ප්‍රයෝජන පහක් ලියා තිබිය යුතු ය. (ලකුණු 05යි)

******

Department of Examinations-Sri Lanka